ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date **3.04.2020**

වැඩ බලන පොලිස්පතිතුමා
පොලිස් මුලස්ථානය
කොළඹ 1

<u>වෛරී ප්‍රකාශන පිළිබඳව නීති ප්‍රකාරව දැඩි පියවර ගැනීමේ අවශ්‍යතාවය</u>

මේ අවස්ථාවේදී අප රට මුහුණපා ඇති දැඩි අභියෝගාත්මක තත්වය හමුවේ ඔබතුමාත්, පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීනුත් දිවා රෑ නොබලා කරන්නා වූ මෙහෙවර වෙනුවෙන් ප්‍රථමයෙන් අප කොමිෂන් සභාව ඔබ දෙපාර්තමේන්තුවට ප්‍රණාමය පුද කිරීමට කැමැත්තෙමු.

ඔබතුමා දන්නා පරිදි පසුගිය දින කිහිපය තුල විශේෂයෙන්ම කෝවිඩ්-19 අධි-වසංගතය ආශ්‍රිතව මුස්ලිම් ප්‍රජාවට එරෙහිව සමාජ මාධ්‍ය ඔස්සේ හා යම් ප්‍රධාන ප්‍රවාහයේ මාධ්‍ය ඔස්සේද ප්‍රකාශයට පත් කොට ඇති වෛරී ප්‍රකාශන පිළිබඳව අප කොමිෂන් සභාවට නොයෙකුත් පාර්ශවයන්ගෙන් පැමිණිලි ලැබී ඇති අතර අප කොමිෂන් සභාවේ අවධානයද ඒ පිළිබඳව දැඩි ලෙස යොමු වී ඇත්තේය. ජන ජීවිතයට ඉතා ප්‍රබල අභියෝගයක් එල්ල වී ඇති මෙවන් අවස්ථාවකදී මෙම වෛරී ප්‍රකාශන තුලින් ඇති විය හැකි නොසන්සුන්තාවය හැකි ඉක්මනින් වලක්වා ගැනීම අප සියලු දෙනාගේම යුතුකම බැව් ඔබතුමා පිළිගන්නවා ඇත. එහෙයින්, එවන් වෛරී ප්‍රකාශන සිදු කරන පුද්ගලයන්ට එරෙහිව ඔවුන්ගේ තරාතිරම නොබලා රටේ පවතින නීතිය යටතේ, විශේෂයෙන්ම 2007 අංක 56 දරණ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සම්මුති පනතේ 3වන වගන්තිය ප්‍රකාරව, දැඩි නීතිමය පියවර ගන්නා මෙන් ඔබතුමාගෙන් අප කොමිෂන් සභාව ඉල්ලා සිටිමු.

දැනටමත් මෙම වසංගතය ආශ්‍රිතව අසත්‍ය තොරතුරු ප්‍රචාරය කරන පුද්ගලයන්ට එරෙහිව දැඩි නීතිමය පියවර ගැනීමට ඔබ දෙපාර්තමේන්තුව කැපවී සිටීම අප ඉතා අගය කොට සලකන්නෙමු. ඒ හා සමාන ලෙස දැනට පවත්නා තත්වය සමනය කිරීම සඳහා වෛරී ප්‍රකාශන ඉදිරිපත් කරන පුද්ගලයන්ට එරෙහිවද නීතිමය වශයෙන් දැඩි ලෙස කටයුතු කිරීමට ඇති යුතුකම ඔබ නොපිරිහෙලා ඉටු කරන්නේයැයි අප අපේක්ෂා කරන්නෙමු.

ඔබතුමා දන්නා පරිදි සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සම්මුති පනතේ 3වන වගන්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සම්පාදනය කරන ලද මාර්ගෝපදේශ දැනටමත් අප ඔබතුමාට ඉදිරිපත් කර ඇත්තෙමු.

සභාපතිනිය
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව